# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1394 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 07/11/2023 පැය 1125

## මාධ්‍ය නිවේදනය

**අන්සතු විදේශ ගමන් බලපත්‍ර ළඟ තබා ගැනීම, කූඨ ලේඛන සෑදීම හා ඊට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම - පානදුර වලාන මධ්‍යම දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය.**

2023.11.05 වන දින දහවල් කාලයේදී කොටුව දුම්රියපළ ඉදිරිපිටදී පානදුර වලාන මධ්‍යම දූෂණ මර්ධන ප්‍රහාරක ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර නිසි බලධාරියාගේ අවසරයකින් තොරව අන්සතු විදේශ ගමන් බලපත්‍ර සන්තකයේ තබා ගැනීම හා පුද්ගලයින් විදේශ ගත කරවීමට අදාල කූඨ ලේඛන ළඟ තබා ගැනීම සම්බන්ධව සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 හා 42 වයස් වල පසුවන ගම්පහ හා ජා ඇළ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරුවන් සන්තකයේ තිබී අන්සතු විදේශ ගමන් බලපත්‍ර 04ක්, ඉතාලි රටේ නිකුත් කරන ලද වීසා බලපත්‍ර වලට සමාන ව්‍යාජ ලෙස සකසන ලද වීසා බලපත්‍ර සහ ව්‍යාජව සකස් කරන ලද ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ටිකට්පත් කිහිපයක්ද සොයා ගෙන ඇත.

සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදි මොවුන් විසින් ඉතාලි රටේ රැකියා ලබා දෙන බවට පවසා මුදල් ලබාදුන් පුද්ගලයින්ට මෙම ව්‍යාජ ලේඛන පෙන්වා තවදුරටත් එම පුද්ගලයින්ගෙන් මුදල් ලබා ගෙන ඇති බවටද අනාවරණය වී ඇත.

සැකකරුවන්ගෙන් කරන ලද ප්‍රශ්න කිරීමේදී මෙම වංචාවට ආධාර අනුබල දුන් තවත් සැකකරුවෙකු කිරිබත්ගොඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකරු සන්තකයේ තිබී කූඨ ලේඛන කිහිපයක් හා කූඨ ලේඛන අන්තර්ගත ජංගම දුරකතනයක් සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48ක් වන කුලියාපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරුවන් විසින් අවිස්සාවේල්ල, රුවන්වැල්ල හා වැල්ලවාය පොලිස් වසම් වල මෙවැනි මුදල් වංචා සිදුකර ඇති බවට එම පොලිස් ස්ථාන වෙත පැමිණිලි ලැබී ඇත. මෙම සැකකරුවන් තවත් පිරිසක් සම්බන්ධ කර ගෙන දීර්ඝ කාලයක සිට මෙම ජාවාරම සිදු කර ඇති බවට දැනට සිදු කල විමර්ශන වලදී අනාවරණය වී ඇත. සැකකරුවන් වැඩිදුර විමර්ශන කටයුතු සඳහා අවිස්සාවේල්ල පොලිස් ස්ථානයට භාර දී ඇත.

මෙම ජාවාරමට සම්බන්ධ අනෙක් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා සීතාවකපුර කොට්ඨාස විශේෂ අපරාධ විමර්ශන ඒකකය සහ වලාන මධ්‍යම දූෂණ ප්‍රහාරක ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**